# කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයෙන් හෙළිවන වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ විමර්ශනයක්

හර්ෂණී පී. පී. ආර්. ජේ. එන්.
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය.

**සංක්ෂිප්තය**

කිසියම් වූ සමාජයක අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් වෛද්‍ය ශාස්ත්‍රය දැක්විය හැකි ය. පුරාණ ඉන්දියාවේ මෙන් ම ලංකාව තුළ ද වෛද්‍ය අංශයේ ක්‍රමවත් දියුණුවක් ඇති වූ බව කරුණු විමසීමේ දී පෙනී යයි. රටක දේශපාලනික පසුබිම තුළ බලය ගොඩනඟා ගැනීමත් එය ක්‍රමානුකූල ව වර්ධනීයත්වයට පත්කර ගනිමින් පවත්වා ගෙන යාමත් ඉතා වැදගත් ය. මෙකී පසුබිමක් ඇති කරගැනීම උදෙසා එම සමාජයෙහි වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ නිපුණත්වය ඉවහල් වනු ඇත. ඒ බව අර්ථශාස්ත්‍රය අධ්‍යයනයෙන් මනාව පැහැදිලි වේ. මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ භාරතය තුළ සතුරු සේනා විනාශ කිරීමේ දී පාලකයන් විසින් යුදමය උපක්‍රමයක් වශයෙන් ඖෂධ භාවිත කරමින් සේනා විනාශ කළ ආකාරය පිළිබඳ වත් රාජ්‍යය තුළ වෛද්‍යවරයාට හිමි වූ ස්ථානය පිළිබඳ වත් නොයෙක් රෝග හා එම රෝගවලට සිදු කරන ලද ප්‍රතිකාර මෙන් ම ඇත්, අස් යනාදී වූ සත්ත්වයන් උදෙසා වූ චිකිත්සකයන්ගේ කාර්යය පිළිබඳ වත් ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් ඇතැම් අවස්ථාවල දී නියම ව තිබූ දඬුවම් පිළිබඳ වත් අනාවරණය කරගැනීම යි. මෙහි දී ක්‍රමවේදය වශයෙන් පර්යේෂණ මාතෘකාවට අදාළ සාහිත්‍ය මූලාශ්‍රයන් ඔස්සේ කරුණු ඒකරාශී කරණු ලැබිණි. පුරාණ භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම අන්තර්ගත වන අර්ථශාස්ත්‍රය නම් වූ ග්‍රන්ථය කෞටිල්‍ය හෙවත් චාණක්‍ය පඬිවරයා විසින් රචනා කර ඇත. අර්ථශාස්ත්‍රයෙහි රට ආරක්ෂා කරගැනීමත් එහි දී තම බලය පවත්වා ගෙන යමින් බලය තහවුරු කරගැනීම පිළිබඳ වත් තොරතුරු රැසක් අන්තර්ගත ය. මෙකී කරුණු අතර සතුරන් මෙන් ම රාජද්‍රෝහීන් විනාශ කිරීම උදෙසා භාවිත කළ ඖෂධ වර්ග, විෂ සංයෝග, ගුප්ත උපක්‍රම ආදී වේ. ඒ හැරුණු කොට ආරෝග්‍යශාලා පිහිටුවිය යුතු ස්ථානය, වෛද්‍යවරුන්ට දඬුවම් ලබාදීම, අන්ධ බවට පත් කරන, බිහිරි හා ගොළු බවට ලක් කරන, කුෂ්ඨ ඇති වීම හා එය වැළැක්වීම, උන්මාදයට පත් කරන, ප්‍රාණය නැති කරන, හිසේ රෝග දුරු කරලන, අරිෂ්ට යනාදිය පිළිබඳ ව තොරතුරු රාශියක් අර්ථශාස්ත්‍රයෙන් හෙළි කරගැනීමට හැකි විය. අර්ථශාස්ත්‍රය තුළ සඳහන් ඖෂධ, රෝග හා ප්‍රතිකාර යනාදිය පිළිබඳ ව අවධානය යොමුකිරීමේ දී ඇතැම් අවස්ථාවල දී බලය ගොඩනඟා ගැනීමේ පරමාර්ථයෙන් ඖෂධ වර්ග භාවිත කළ බවත් යම් යම් රෝගාබාධවලට සාර්ථක ප්‍රතිකාර ක්‍රියාත්මක කළ බවත් සාර්ථක වූ වෛද්‍ය ශාස්ත්‍රයක් එවක පවතින්නට ඇති බවත් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අර්ථශාස්ත්‍රය, වෛද්‍යවරු, ඖෂධ, ප්‍රතිකාර

**විද්‍යුත් ලිපිනයඃ** nisansalaharshani200@gmail.com